## විභාග උත්තර පත්‍ර පරික්ෂාව වෙනුවෙන් පරීක්ෂකවරුන් සංචිතය සඳහා තෝරා ගැනීමේ අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ විභාග අංශය විසින් රාජ්‍ය ආයතන, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය ව්‍යවසායන්හි බඳවාගැනීම්, උසස් කිරීම් හා කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සිදු කරනු ලැබේ. ඉදිරියේදී මෙම ආයතනය විසින් විභාග පැවැත්වීම වඩාත් පුළුල් ලෙස සිදුකිරීමට අපේක්ෂා කරනු ලැබේ.

ඒ අනුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන විභාගයන්හි උත්තර පත්‍ර පරික්ෂාව වෙනුවෙන් පරීක්ෂකවරුන් සංචිතයක් තෝරා පත් කර ගැනීම සඳහා සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ සඳහා පහත දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද නිලධාරීන්ට https://forms.office.com/r/6b8PqhQUM2 සබැඳිය ඔස්සේ මාර්ගගත ක්‍රමයට හෝ https://www.slida.lk/announcement සබැඳියෙන් තම අයදුම්පත් බාගත කර **2024.05.31** දින හෝ එදිනට පෙර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කළ යුතුය.

**සුදුසුකම්**

1. දීප ව්‍යාප්ත සේවයේ නිලධාරියෙකු වීම
2. 2024.05.31 දින වන විට වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

- 2024.05.31 දිනට පෙර වසර 05 ක් තුළ විශ්‍රාම ලබා ඇති දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන්ටද මේ සඳහා අයදුම් කළ හැක.

තැපැල් මඟින් අයදුම්පත් ඉදිරිපත් කරන්නේ නම් අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ *"උත්තර පත්‍ර පරීක්ෂකවරුන් තෝරා ගැනීම"* ලෙස සඳහන් කර *අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07* ලිපිනයට එවිය යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
කොළඹ 07.
2024.05.08